**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය - 2020**

---

## 1.1 මතය

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ ("යෝජනා ක්‍රමය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

යෝජනා ක්‍රමයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී, මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමය විසින් යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයන් සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව යෝජනා ක්‍රමය කටයුතු කර ඇති බව; සහ

- යෝජනා ක්‍රමයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 11.3 ක පාඩුවක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ලාභය රු. බිලියන 10.6 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. බිලියන 21.9 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂය තුළදී වන්දි ගෙවීම් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ. 2010 අංක 1 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රම රෙගුලාසිවල 9.4 වගන්තිය ප්‍රකාරව, සාමාජික ආයතනයේ බලපත්‍රය අවලංගු කළ දින සිට මාස හයක් ඇතුළත නිශ්චිතව දක්වා ඇති සීමාවන් තුළ වන්දි ගෙවනු ලැබේ. කෙසේ වුවද, 2018, 2019 සහ 2020 යන වර්ෂයන් තුළදී බලපත්‍ර අවලංගු කරන ලද සාමාජික ආයතන හයක තැන්පත්කරුවන්ට ගෙවිය යුතු මුළු වන්දි මුදලින් සියයට 70 ක් නියෝජනය කරමින් රු. බිලියන 18.2 ක් වූ වන්දි මුදලක් පමණක් මාස හයක් ඇතුළත ගෙවා තිබුණි. | එකඟ වේ. | නියමිත කාලයට අනුගත වීම. |
| ආ. මුදල් මණ්ඩලයේ අනුමත වන්දි ක්‍රියාපටිපාටියේ 1.3.1 (ඇ) වගන්තිය ප්‍රකාරව, අදාළ නියාමක ලෙස බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් යෝජනා ක්‍රමය මඟින් ලබා දී ඇති ආකෘතියට අනුව, නියාමක විසින් සහතික කරන ලද තැන්පත්කරුවන්ගේ ලැයිස්තුව ක්‍රියාකාරී කමිටුවට ඉදිරිපත් කළ යුතුය. සහතික කරන ලද තැන්පත්කරුවන්ගේ ලැයිස්තුවේ නිරවද්‍යතාවය සත්‍යාපනය කිරීම, සාමාජික | එකඟ වේ. | එම ක්‍රියාපටිපාටියට අනුකූල වීම. |

ආයතනයක බලපත්‍රය අවලංගු කළ දින සිට මාස දෙකකට වඩා ප්‍රමාද නොවන කාල සීමාවක් තුලදී අදාළ නියාමක විසින් සෘජුවම හෝ විගණකවරයෙකු හරහා කළ යුතුය. කෙසේ වෙතත්, බලපත්‍ර අවලංගු කරන ලද සාමාජික ආයතන හයකට අදාළව එවැනි තැන්පත්කරුවන්ගේ ලැයිස්තුවක් නියාමක විසින් සහතික කර නොතිබුණි. එවැනි නියාමක සහතික කළ තැන්පත්කරුවන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කිරීමට ඇති නොහැකියාව පිළිබඳව නියාමක විසින් මතු කරන ලද කරුණු සැලකිල්ලට ගනිමින් විකල්ප ක්‍රියා පටිපාටීන් අනුගමනය කිරීමට මුදල් මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි.

**3.2 සාමාජික ආයතනවලට ණය ප්‍රදානය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2010 අංක 1 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රම රෙගුලාසිවල 8.1 (ii) වගන්තිය ප්‍රකාරව, කිසියම් සාමාජික ආයතනයක දැඩි ද්‍රවශීලතා අර්බුදයක් පවතින විටදී එවැනි සාමාජික ආයතනයකට සුරක්‍ෂිත අත්තිකාරම් හෝ ණය ලබා දෙනු ලැබේ. ඒ අනුව, 2014 දෙසැම්බර් 15 වන දින සාමාජික ආයතනයකට රු. බිලියන 6 ක ණයක් ලබා දී ඇත. සමාලෝචිත වර්ෂය අවසානයේදී ලැබිය යුතු ණය මුදල රු. බිලියන 1.5 ක් විය. මුදල් ව්‍යාපාරය කරගෙන යාම සඳහා එම සාමාජික ආයතනය වෙත නිකුත් කළ බලපත්‍රය 2020 මැයි 22 දින සිට බලාත්මක වන පරිදි මුදල් මණ්ඩලය විසින් අවලංගු කරන ලදී. 2018 දෙසැම්බර් 20 දිනැති තක්සේරු වාර්තාවට අනුව, ප්‍රදානය කරන ලද ණය මුදලට එරෙහිව උගස් කරන ලද දේපලෙහි වෙළඳපල වටිනාකම රු. බිලියන 1.187 ක් විය. කෙසේවෙතත් 2020 දෙසැම්බර් 31 දිනට මෙම දේපලට අදාළව තක්සේරුවක් සිදු කර නොතිබුණි. තවද, 2020 දෙසැම්බර් මාසය අවසානයේදී ප්‍රදානය කරන ලද ණය මුදලට එරෙහිව උගස් කරන ලද සුරැකුම්පත් කළඹේ අනාගත වටිනාකම රු. මිලියන 51.8 ක් විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට රු. මිලියන 903 ක හානිකරණ වෙන්කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර තිබුණි. | එකඟ වේ. | ලැබිය යුතු ණය ශේෂය අය කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. |

**3.3 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| යෝජනා ක්‍රමය විසින් ප්‍රාථමික අලෙවිකරුවකු සමඟ රු. මිලියන 147.05 ක මුදලකට 2016 මාර්තු 31 දිනට කල් පිරෙන ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමක රු. මිලියන 137.18 ක මුදලක් 2015 අප්‍රේල් 01 දින ආයෝජනය කර | එකඟ වේ. | අනාගතයේදී එවැනි අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය |

| | | |
|---|---|---|
| තිබුණි. ප්‍රාථමික අලෙවිකරු විසින් ඉහත ආයෝජනය සඳහා පාදක වූ සුරැකුම්පත්, ඒ වෙනුවෙන් කිසිදු සුරැකුම්පතක් ආදේශ නොකර ඉවත් කර ගෙන තිබුණි.<br>ඒ අනුව, ඉහත සඳහන් ආයෝජනය සඳහා රු. මිලියන 144.25 ක් වූ හානිකරණයක් 2015 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර තිබුණි. මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2020 අගෝස්තු 19 දින ගනු ලැබූ මණ්ඩල තීරණයට අනුව, 2015 සිට ඉහත ආයෝජනය ප්‍රතිආයෝජනය කිරීම, නතර කිරීමට තීරණය කර තිබුණි. 2015 සිට එම ආයෝජනය ප්‍රතිආයෝජනය කිරීමෙන් එකතු වූ පොළිය රු. මිලියන 61.83 ක් 2020 සැප්තැම්බර් දක්වා හඳුනා ගෙන නොතිබුණි. | | පියවර ගැනීම සහ අලාභය පියවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. |

**3.4 අරමුදලෙන් ගෙවීම් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 අංක 1 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රම රෙගුලාසිවල 9.10 වගන්තිය ප්‍රකාරව, 2012 ජනවාරි 01 දින හෝ ඊට පසුව මුදල් මණ්ඩලය විසින් අත්හිටුවීම / අවලංගු කිරීම පිළිබඳව නියෝග කර ඇති විටකදී වන්දි ගෙවීම බලාත්මක වේ. ඒ අනුව, 2018, 2019 සහ 2020 යන වර්ෂයන් තුළදී සාමාජික ආයතන හයක බලපත්‍ර මුදල් මණ්ඩලය විසින් අවලංගු / අත්හිටුවීම කරන ලදී. ලද තොරතුරු අනුව, සාමාජික ආයතන තුනක තැන්පත්කරුවන් 7,424 කට රු. බිලියන 3.05 ක වන්දි ගෙවා තිබුණු අතර ඒ අතුරින් රු. මිලියන 834 ක වන්දි සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෘජුවම ගෙවා තිබුණි. බලපත්‍ර අවලංගු කළ/ අත්හිටවූ සාමාජික ආයතනවල තැන්පත්කරුවන්ට වන්දි ගෙවීම සඳහා මුදල් මණ්ඩලය රාජ්‍ය අංශයේ බැංකුවක් (නියෝජිත බැංකුව) සමඟ ගිවිසුම්වලට එළඹුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී නියෝජිත බැංකුව හරහා ඉහත සඳහන් සාමාජික ආයතන හය අතුරින් අනෙත් සාමාජික ආයතන තුනේ තැන්පත්කරුවන් 59,309 කට රු. බිලියන 18 ක වන්දි ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට ඉහත සඳහන් සාමාජික ආයතන හයේ තැන්පත්කරුවන් 187,753 කට ගෙවිය යුතු ඉතිරි වන්දි මුදල රු. බිලියන 4.6 ක් විය. මෙම යෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු උපරිම වන්දි මුදල රු. 600,000 සිට රු. 1,100,000 දක්වා රු. 500,000 කින් වැඩි කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කර තිබුණි. මූල්‍ය ප්‍රකාශන වලට අනුව, උපරිම වන්දි මුදල ඉහළ නැංවීමෙන් ඉහත සඳහන් සාමාජික ආයතන හයේ තැන්පත්කරුවන් සඳහා රු. බිලියන 9.6 ක අතිරේක ගෙවීමකට හේතු වනු ඇත. | එකඟ වේ. | වන්දි ගෙවීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම. |